# IV කාර්ය මණ්ඩල පුවත්

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන මහතා, 1962 ජුලි 1 වැනි දින සිට මහ බැංකු අධිපති වශයෙන් නැවතත් පත් කැරිණි. ජාත්‍යන්තර මුදල් මණ්ඩලයෙහි ලංකාවේ විකල්ප අධිපති වශයෙන් රාජපතිරාන මහතා ජාත්‍යන්තර මුදල් ම ණ්ඩලයේ ද, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ ද, ජාත්‍යන්තර මුදල් සමායතනයේ ද, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ද, වාර්ෂික රැස්වීම් වලට සහභාගිවීම් වස් 1962 සැප්තැම්බර් 10 වැනි දින වොෂින්ටනය බලා පිටත්ව ගොස්, ලංකාවට පෙරලා සැපත් වූයේ 1962 සැප්තැම්බර් 28 වැනි දිනය.

මුදල් මණ්ඩලයෙහි, රජයේ සාමාජික එච්. එස්. අමරසිංහ මහතා මුදල් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන්, 1961 අගෝස්තු 26 වැනි ද සිට ස්ථිර කරන ලදි.

1962 මාර්තු මස, ටෝකියෝ නුවර දී පැවැත්වුනු ආසියාවේ හා ඈත පෙරදිග ආර්ථික කොමිසමේ 18 වැනි සැසි වාරයට ගිය ලංකාණ්ඩුවේ නියෝජිත මණ්ඩලයේ ප්‍රධාන විකල්ප නියෝජිතයා වූයේ මහ බැංකුවේ නියෝජිත, නියෝජ්‍ය අධිපති ඩබ්ලිව්. තෙන්නකෝන් මහතාය. 1962 මාර්තු 3 වැනි දින ඒ සඳහා ලංකාවෙන් පිටත් වූ තෙන්නකෝන් මහතා, මාර්තු 27 වැනි දින ආපසු පැමිණියේය එක්සත් ජාතීන්ගේ 17 වැනි මහා සම්මේලනයේ නියෝජිතයෙකු වශයෙන් තෙන්නකෝන්. මහතා ලංකා රජයෙන් පත් කරන ලදින්, 1962 සැප්තැම්බර් 14 වැනි දින, ඒ සඳහා ලංකාවෙන් පිටත් විය. 1962 නොවැම්බර් 1 වැනිද සිට තෙන්නකෝන් මහතා ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ විකල්ප අධ්‍යක්ෂ වශයෙන් ද, පත් කැරිණි. තෙන්නකෝන් මහතා එහි සේවාව කරන අතරම, 1962 දෙසැම්බර් 18 වැනිද තෙක් එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයට ද සහභාගි විය.

ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ, වැඩ බැලීම සඳහා අධිපතිවරුන්ගේ සහකාර ඩී. සී. ගුණසේකර මහතා, වැඩ බලන නියෝජ්‍ය අධිපති වශයෙන්, 1962 සැප්තැම්බර් 15 වැනිද සිට පත් කැරිණි.

එක්සත් ජාතීන් විසින්, බ්‍රිතාන්‍ය හොන්දුරාවේ ආර්ථික සැළසුම් කටයුතු සඳහා යැවුණු දූත මණ්ඩලයේ ප්‍රධානයා වශයෙන් පත් කැරුන, ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ ආචාර්ය ගාමිණී කොරෙයා 1962 ජුනි 20 වැනි දින, ඒ සඳහා පිටත්ව ගොස් පෙරළා ලංකාවට පැමිණියේ 1962 නොවැම්බර් 20 වැනිද ය.